# ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා වන කාර්යාලයට නව අධ්‍යක්ෂිකාවක් පත් කෙරේ

## ජොනී සිම්ප්සන් මහත්මිය 2024 ජනවාරි 15 දින වැඩ භාර ගනී.

**කොළඹ (ILO පුවත්)**

Press Release

2024 ජනවාරි 15 වැනි දින ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂවරිය ලෙස ජොනී සිම්ප්සන් මහත්මිය සිය රාජකාරි ආරම්භ කළාය. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) අධ්‍යක්ෂ ජනරාල් ගිල්බර්ට් හුංග්බෝ මහතා විසින් පත් කරන ලද සිම්ප්සන් මහත්මිය ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ වැඩ ලෝකය සඳහා සැවොම අන්තර්ගත කිරීමට ඉඩ සැලසුම් කිරීම ආදි වසර 25කට වැඩි පළපුරුද්දක් ඇය ශ්‍රී ලංකාවට රැගෙන එයි.

සිම්ප්සන් මහත්මිය ශ්‍රී ලංකාවට පත්වීමට පෙර, නැගෙනහිර ආසියාව, අග්නිදිග ආසියාව සහ පැසිෆික් කලාපය ආවරණය කරමින් ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ වෙනස්කම් නොකිරීම පිළිබඳ ජ්‍යෙෂ්ඨ විශේෂඥවරියක් ලෙස සේවය කළාය. රැකවරණ ප්‍රතිපත්තිය සහ සේවා සැපයීම වැඩි දියුණු කිරීම; සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) ව්‍යාපාර සහ ආබාධිත ජාලය ප්‍රවර්ධනය කිරීම ආදිය ඇය ප්‍රමුඛත්වයක් දැරූ අංශයන් වේ. ඇය 2023 වසරේ මුල් භාගයේදී නේපාලයේ කත්මන්ඩු හි පිහිටි ජාත්‍යන්තර කම්කරු සංවිධාන (ILO) කාර්යාලයේ වැඩ බලන අධ්‍යක්ෂ ධූරයද හෙබ වූවාය. මීට පෙර ඇය ජිනීවාහි ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) මූලස්ථානය කේන්ද්‍ර කරගත් කාන්තා ව්‍යවසායකත්වය සහ ව්‍යවසායකත්ව අධ්‍යාපනය පිළිබඳ ගෝලීය ප්‍රයත්නයන්ට නායකත්වය දුන්නාය.

කැනේඩියානු ජාතිකයෙක් වන සිම්ප්සන් මහත්මිය, සංස්කෘතික මානව විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ අධ්‍යාපනවේදී උපාධියක් ලබා ඇත.

ජාත්‍යන්තර කම්කරු සංවිධානය යනු වැඩ ලෝකය සඳහා වන එක්සත් ජාතීන්ගේ විශේෂිත ආයතනය වන අතර ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් සම්පාදනය, තාක්ෂණික සහාය ලබා දීම මෙන්ම සේවා නියුක්තිය, කම්කරු අයිතිවාසිකම් සහ සමාජ ආරක්ෂණය සම්බන්ධයෙන් වන තීරණාත්මක ගැටළු විසඳීම සඳහා ප්‍රතිපත්තිමය සංවාදයන්ට එළඹීම එහි ප්‍රධාන කාර්යයන් වේ. තවද ලොව පුරා සමාජ සාධාරණත්වය වර්ධනය කිරීමේ සහ සුනිසි රැකියා ප්‍රවර්ධනය කිරීමේ මෙහෙවර සාක්ෂාත් කිරීම සඳහා රජයන්, සේවා යෝජක හා සේවක සංවිධාන සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කරන ආයතනයකි.

**ILO Office for Sri Lanka and the Maldives**
**202 – 204, Bauddhaloka Mawatha,**
**Colombo 7,**
**Sri Lanka.**

**Tel. +94 11 259 2525**
**Fax. +94 11 250 0865**
**E-mail: colombo@ilo.org**

*For information only – Not an official record*

International Labour Organization

Web Facebook Twitter Flickr Youtube

Press Release

**ILO Office for Sri Lanka and the Maldives**
**202 – 204, Bauddhaloka Mawatha,**
**Colombo 7,**
**Sri Lanka.**

**Tel. +94 11 259 2525**
**Fax. +94 11 250 0865**
**E-mail: colombo@ilo.org**

*For information only – Not an official record*